# ‘The Legend of Bhagat Singh’ සිනමා කෘතිය හා භගත් සිං චරිතාපදානය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

*කොබ්බෑකඩුව, එච්. ජී. ඒ. වී. කේ. එම්.* [1]

සිය මව්බිමට, තම මවට මෙන් ගෞරව කිරීමේ සංකල්පයට භාරතීය වැසියා මහත් අභිමානයෙන් යුතුව හිස නමයි. ඉන්දියානු නිදහස් අරගලයට උර දුන් ජාතික වීරයන් අතර ජීවිත පූජාවෙන් සටන් වැදුණු ලාබාලතම හා බලවත්ම විප්ලවීය සටන්කාමියා ලෙස සික් ජාතික **‘භගත් සිං’** (ක්‍රි. ව. 1907-1931) සම්භාවනාවට පාත්‍ර වේ. උපතින්ම සටන්කාමී පරපුරක පුරුකක් වූ හෙතෙම උපාධිධාරියෙකුද විය. වහල් වූ මව්බිමේ සිට මාගේ විවාහය සිදු වේ නම් මනාලිය වන්නේ මරණය බව පවසා සිය විවාහය ප්‍රතික්ෂේප කළ භගත් සිං, හිංසාකාමී අධිරාජ්‍යවාදයට අවිහිංසාවෙන් පිළිතුරු දුන් ගාන්ධිගේ දර්ශනයට විරුද්ධව කටයුතු කළේය. විප්ලවවාදී දේශප්‍රේමී දර්ශනයක් අනුගමනය කළ මේ ශ්‍රේෂ්ඨ වීරයා 23වන වියෙහිදී, සුඛදේව් හා රාජගුරු යන සහායකයන් සමග නියමිත දිනයටත් පෙර එල්ලා මරා රහසේ පුළුස්සා දමන ලදි. මොහුගේ ජීවන චරිතය අලළා නිර්මිත ශ්‍රව්‍ය-දෘශ්‍ය කෘති රැසකි. ඒ අතරින් කේ. එන්. බන්සාලිගේ අධ්‍යක්ෂණයෙන් 1963දී තිරගත වුණු **‘ශහීද් භගත් සිං’** සහ රාජ් කුමාර් සන්තෝෂීගේ අධ්‍යක්ෂණයෙන් 2002දී තිරගත වූ **‘The Legend of Bhagat Singh’** සිනමා කෘති ද්වය, සිනමාවට නැගුණු භාරතීය දේශප්‍රේමීන්ගේ තොරතුරු ගොනුවේ අදටද වැදගත් වේ. මෙහි ප්‍රමුඛස්ථානයක් උසුලන සම්මානලාභී සිනමා කෘතියක් වන The Legend of Bhagat Singh සිනමා කෘතිය ඊට පාදක වූ භගත් සිංගේ චරිතාපදානයට හා තත්කාලීන භාරතයට අනුගතව නිර්මාණය කර ඇත්තේ කෙසේද යන්න විමසා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. කාල වකවානු සහිතව මිනිත්තු 155ක් පුරා දිවෙන මෙම සිනමා කෘතියේ ගීත 05කි. සිනමා කෘතියේ චරිත, භාෂාව, රූපරාමු, ගීත ආදිය මෙන්ම භගත් සිංගේ චරිතාපදානය හා කාලීන භාරතය මෙහිදී විමසා බැලේ.

**ප්‍රමුඛ පද:** ඉන්දියානු නිදහස් අරගලය, සටන්කාමියා, භගත් සිං, සිනමා කෘතිය

[1]*ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*kobbekaduweanuradha@gmail.com*